**මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.06.13 දින පැවති මහා සභාවේ වාර්තාවයි.**

2022.06.13 වන දින පෙ.ව 09.30 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
අද දින සභා රැස්වීම සඳහා පැමිණ සිටින ඔබ සියලුම දෙනා ඉතාමත් ආදරයෙන් පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව අද දින සභා කටයුතු ආරම්භ කර සිටින අතර හදිසි අවශ්‍යතාවයක් මත ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා හට අද දින සභා රැස්වීමට පැමිණීමට නොහැකි වන බව ලේකම්තුමා වෙත දුරකථනයෙන් දන්වා නිවාඩු ඉල්ලා ඇතිබවද දැනුම් දෙමි. මීළඟට පසුගිය සභාවේ වාර්තාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
පසුගිය සභා වාර්තාවේ 14 වන පිටුවේ කාරණා අංක 02 යටතේ සෞඛ්‍ය කංකානම එස්.ආනන්දන් මහතා පිළිබඳ සාකච්ඡාවක් සිදුකර තීරණයක් ලබාගෙන තිබෙනවා. එකී තීරණයට අනුව එම විමර්ශනය කුමන තත්වයක පවතින්නේද? ඒ අනුව ලබා ගන්නා ලද ක්‍රියාමාර්ගය කුමක්ද? එසේ නොමැතිනම් එම විමර්ශනය දින කිහිපයකට පැවැත්වෙනවාද? යන්න ගරු සභාපතිතුමියගෙන් දැනගැනීමට කැමැත්තෙමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
එම ගැටළුව සඳහා පසුගිය 10 වන දින විමර්ශන නිලධාරි මහතා පැමිණ සිටි නමුත් එදින පළාත් පාලන සම්මේලනයේ එකහතා ගිවිසුම අත්සන් කිරීමද කළ යුතුව තිබුණු හෙයින් මෙම විමර්ශනය සඳහා වෙනත් දිනයක් විමර්ශන නිලධාරී මහතා විසින් ලඟදීම ලබාදෙනු ඇත.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
විමර්ශනය සිදුකළ යුත්තේ අදාල සභා රැස්වීම පවත්වා දින කීයක් තුලද? ඒ සම්බන්ධව කරුණු කාරණා තිබෙනවා. මෙම විමර්ශනය විධිමත්ව සිදුකළ යුතුයි. මෙම කටයුත්ත පිළිබඳව පැමිණිලි ලිපි තිබෙන බවට පසුගිය සභා වාරයේදී සඳහන් කළත් එම ලිපිද ඉදිරිපත් කළේ නැහැ.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
විමර්ශනය සිදුකරන අවස්ථාවේදී ඒ සියල්ල ඉදිරිපත් කරනු ලබනවා.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
විමර්ශනයක් සඳහා ගෙන්වා ගැනීම සම්බන්ධව සාරධර්ම පිළිපැදිය යුතුයැයි මා අදහස් කර සිටිනවා. පසුගිය සභා වාරයේදී මේ පිළිබඳව සාකච්ඡා කර අද දින සභා රැස්වීම දක්වා විමර්ශනය නොකිරීමට හේතු මොනවාද? එම නිලධාරියා මේ පිළිබඳව වැඩිදුර කටයුතු සඳහා පිවිසෙන්නේ නම් එය සුදුසු බවට මම අදහස් කරමි. විමර්ශන නිලධාරී පසුගිය 10 වන දින විමර්ශන කටයුතු සඳහාම පැමිණියේ නම් මේ පිළිබඳව කරුණු ඉටුකර තිබිය යුතුයි. එම වැඩසටහන පැය දෙකක් පැවැත්වුවා නම් මෙම විමර්ශන කටයුතු සඳහා පැයක කාලයක් වෙන්කර කටයුතු කරන්න තිබුණානේද? සභාවේ මෙපමණ සාකච්ඡා කර විමර්ශනයක් සිදු නොකළේ නම් මෙම කොළ ටිකත් අපරාදෙ නේද?

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
සභාවේ සෞඛ්‍ය අංශයේ සේවය කරන පී.ආනන්දන් මහතා පිළිබඳව පසුගිය මුදල් කමිටුවේදී සාකච්ඡා කර අනතුරුව සභාවට ඉදිරිපත් කර තිබුණා. ඒ අවස්ථාවේදි ගරු සභාපතිතුමිය සහ ලේකම්තුමා මහින්ද අදහසක් ඉදිරිපත් කර තිබුණා. ඔහුගේ සේවයේ ගැටළුවක් නැහැ. ඔහු පිළිබඳව පෞද්ගලිකව චෝදනාව ඉදිරිපත් වී තිබෙනවා. එනිසා ඔහු පිළිබඳව විනය පරීක්ෂණයක් සිදුකරන බවට පැවසුවා. එක්තරා ආයතනයක යම්කිසි නිලධාරියෙකුට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කරන්නේ නම් ඒ පිළිබඳව එම නිලධාරියා වෙත දැනුම් දිය යුතුයි. ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුවට යන්නේ නම් ඔහුව අපහාස කළ බවට අර්ථවත් වන්නේ නැහැ. මෙම කාරණාව දැනට ප්‍රසිද්ධ වෙලයි තිබෙන්නේ. මෙයත් අපහාසයක් තමයි. ඔහු වැරදි කර ඇත්නම් මෙවැනි චෝදනාවක් තමන්ට විරුද්ධව තිබෙන බවට පළමුව ඔහු දැනගෙන සිටිය යුතුයි. කෙනෙකු

චෝදනාවකට ලක් වී ඇත්නම් ඒ පිළිබඳව ඔහු දැනුවත් කර දින 14 ක් තුල ඔහුට විරුද්ධව කටයුතු කළ යුතුයි. මෙහිදී එවැනි කටයුත්තක් සිදු නොවීම කණගාටුවට කාරණාවක්. ඔහුට විරුද්ධව පෞද්ගලිකව මුදල් කමිටුවේ සාමාජිකයෙකු තමයි මුදල් කමිටුවට චෝදනාවක් ඉදිරිපත් කර තිබෙන්නේ. සමහර විට පෞද්ගලික ආරවුලක් වෙන්නත් ඉඩ තිබෙනවා. නමුත් ඒ සඳහා මෙතරම් දුරට කාර්යයක් සිදු කිරීමට අවශ්‍ය නැහැ. එසේනම් අදාල මන්ත්‍රීතුමා වහාම ඔහුට විරුද්ධව ඇති චෝදනාව ඉදිරිපත් කර තිබිය යුතුයි. ලිඛිතව හෝ ඉදිරිපත් කර තිබිය යුතුයි. එවැනි දේවල් පිළිබඳව කටයුතු කිරිමේදී නීත්‍යානුකූලව සිදුකළ යුතුයි. පෞද්ගලිකව ආරවුල් තිබෙනවා නම් ඒවා සභාවට ගෙනවිත් සභාවේ කාලය නාස්ති කරන්න එපා.

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
මෙය පෞද්ගලිකව කෙනෙකුට විරුද්ධව සිදුකරන කාරණාවක් නෙවෙයි. මුදල් කමිටුවේ සාකච්ඡා කළ නිසා තමයි සභාවට ඉදිරිපත් කළේ.

<u>**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**</u>
කාගේවත් හිත රිදවීමේ අදහසින් මම මෙය ප්‍රකාශ කළේ නැහැ. කෙනෙකුට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කිරීමේදී පළමුව එය ලිඛිතව ලේඛනයක් වශයෙන් ඉදිරිපත් කළ යුතුයි. බාහිරෙන් බලන අවස්ථාවේදී මෙය එක්තරා පෞද්ගලික ආරවුලක් බවටයි පෙනී යන්නේ. මෙම කාරණාව සත්‍යයක් නම් මෙතෙක් විමර්ශනය සිදු නොකළේ ඇයි? එම මන්ත්‍රීතුමා විසින් මේ පිළිබඳව අවධානය යොමු නොකරන්නේ ඇයි?

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
විමර්ශනය සිදු කරන අවස්ථාවේදී එකී මන්ත්‍රීතුමා ලිඛිතව ලේඛන ඉදිරිපත් කරයි.

<u>**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**</u>
පසුගිය සභා වාරයේදීත් මේ පිළිබඳව මම පවසා තිබුණා. පරිපාලනය භාරව කටයුතු කරනු ලබන්නේ ලේකම්තුමා. ඔහු වැඩ කළාද නැද්ද යන්න පිළිබඳව පරීක්ෂා කිරීමෙන් අනතුරුව තමයි ඔහුට අතිකාල දීමනාව සඳහා ලේකම්තුමා අනුමැතිය ලබා දී ඇත්තේ. ඔහුට විරුද්ධව චෝදනා ඉදිරිපත් කර තිබෙන්නේ නම් එය ලේකම්තුමාගේ අපරික්ෂාකාරී කටයුත්තක්ද?

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
නැහැ. එය ලේකම්තුමාගේ අපරික්ෂාකාරී කටයුත්තක් නෙවෙයි. එදින මේ පිළිබඳව ලේකම්තුමා ඉතා පැහැදිලිව පවසා තිබුණා.

<u>**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**</u>
අදටත් මස්කෙළිය ප්‍රාදේශීය සභාව පිළිබඳව යම් හෝ තරමක හොඳ නාමයක් පවතින්නේ නම් එය සෞඛ්‍ය අංශය නිසයි. ඔවුන් විසින් සිදුකළ වැරදි වසන් කිරීම සඳහා මා මෙය පවසන්නේ නැහැ. කෙනෙකුට විරුද්ධව චෝදනාවක් ඇත්නම් එය ඔප්පු කළ යුතුයි. නිකරුණේ පැවසිය නොහැකියි.

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
හේතුවක් නොමැතිව කවුරුන් හෝ එලෙස පවසන්නේ නැහැ.

<u>**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**</u>
එකී නිලධාරියා සභාව විසින් තමාට අපහාස වන ලෙස ප්‍රකාශ කර සිටින බවට පවසා, ඔහු නඩු පැවරුවහොත් සභාවත් මේ සඳහා පිළිතුරු ලබාදිය යුතු තත්වයක් උදා වේවි. එනිසා මේ පිළිබඳව වහාම තීරණයක් ලබා ගන්න.

<u>**ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)**</u>
පසුගිය මුදල් කමිටුවේදී සෞඛ්‍ය කංකානම පිළිබඳව සාකච්ඡා කර තිබුණා. පෞද්ගලිකව එක් මන්ත්‍රීවරයෙක් පමණක් අදහස් පළකළ බව සඳහන් කර තිබෙනවා. නමුත් අනෙකුත් මන්ත්‍රීවරුන්ද අදහස් පළකර තිබුණා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**
පසුගිය මුදල් කමිටුවේදී අතිකාල දීමනා ගෙවීම සම්බන්ධව සාකච්ඡා කරන අවස්ථාවේදී මේ කාරණාව පිළිබඳව අදහස් ඉදිරිපත් වුණා. මෙහිදී කාටත් යහපත් අයහපත් කරුණු නැහැ. පසුගිය කාලවලදී හේමන්ත යන අය සම්බන්ධවත් මුදල් කමිටුවේදී සාකච්ඡා සිදුවුණා. ඒ අවස්ථාවේදී වුවත් එම කාරණාව අතහැර දැම්මා. එනිසා මෙම කාරණාව පිළිබඳව හෝ විධිමත්ව කටයුතු කරන්න. එදින ඔහු මේවා ඔප්පු කිරීමට අවශ්‍ය සාක්ෂි තිබෙන බවට පැවසීම හේතුවෙන් තමයි මෙය විමර්ශනයට ගන්නා ලෙසට අපි පැවසුවේ.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
චෝදනා ඔප්පු කරන තෙක් ඔහු චූදිතයෙක් පමණයි. මෙවැනි අවස්ථා වලදී ඔබතුමියගේ නිලයට අනුව කටයුතු කරන්න.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**
කෙනෙකු පිළිබඳ ව චෝදනා ඔප්පු නොකර ඔහු පිළිබඳව මේ අයුරින් සභාවේ කතා කළොත් එම කරුණු සභා වාර්තාවට ඇතුලත් වෙනවා.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
පසුගිය සභා වාරයේදී කතාකළ තවත් විෂයක් තමයි සැණකෙළිය පිළිබඳ වූ කාරණාව. ඒ කාරණාව පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ සිට පිළිතුරක් ලැබුණාද? එම පිළිතුර අනුව ගන්නා ලද ක්‍රියාමාර්ගය කුමක්ද?

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**
මාර්තු මාසයට අදාල සභා වාර්තා නිරීක්ෂණ ලිපිය පමණයි ලැබී තිබෙන්නේ. අප්‍රේල් මාසයට අදාල වූ නිරීක්ෂණ ලිපිය මෙතෙක් ලැබුණේ නැහැ. ලිපි ගොනු සියල්ල රැගෙන ගොස් තිබෙනවා.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
මෙම කරුණු මීට පෙර සභාවට පවසන්න තිබුණා නේද?

**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)**
මෙම කරුණු සඳහා ඉක්මණින් කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටින අතර පසුගිය මාසයේ සභා වාර්තාව නිවැරදි බවට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**
එම යෝජනාව මම ස්ථිර කරමි.

**තීරණඅංක 01**
**2022.05.13 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.**

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**
පළාත් පාලන ආයතනවල වත්කම් ඔන්ලයින් ක්‍රමය මඟින් ලියාපදිංචි කිරීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය ලිපියක් යොමු කර තිබෙනවා. මාගේ විශේෂ කතාවේදී ඒ සඳහා අනුමැතිය ඉල්ලා සිටිමි. ලිපි යොමු කිරීමේ අවස්ථාවේදීද මෙය ඉදිරිපත් කරනු ලබනවා. මීළඟට වතුකරයේ විවිධ වැඩසටහන් දියත් කරන ලෙසට මෙහිදී අපි කතා වෙනවා. ඒ වගේම වතුකර ප්‍රදේශවල මේ කාල වකවාණුවේ මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වෙමින් පවතිනවා. එමෙන්ම පාසල් දරුවන්හටද අධික ලෙස මෙය බලපානවා. මෙසේ වුවහොත් අනාගත සමාජය විනාශ වේවි. ගරු මන්ත්‍රීවරුන් වන අප මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුයි. මෙවැනි ක්‍රියාමාර්ග වල යෙදුනහොත් එම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු විනාශ වෙනවා. ළමා ආරක්ෂක සහ පරිවාසයට තමයි මෙම සිසුන් යොමු කරන්න සිදු වන්නේ. එනිසා

අපගේ සමාජ අභිවෘද්ධිය සැලකිල්ලට ගනිමින් ගරු මන්ත්‍රීවරුන් වන අප වැඩි අවධානයක් යොමුකළ යුතු බවට ඉල්ලා සිටිමි. වතුකරයේ ඩෙංගු මර්ධනය සහ කොවිඩ් වසංගතය සඳහා විවිධ වැඩ සටහන් අපි ඉටුකර තිබුණා. නමුත් මේ පිළිබඳව අපි එතරම් අවධානයක් යොමු කළේ නැහැ. එනිසා මේ පිළිබඳව සියළු දෙනා වැඩි අවධානයක් යොමු කළ යුතුයි.

<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>
2018 වර්ෂයේදී පමණ මා මේ පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. මත්ද්‍රව්‍ය තුරන් කිරීම පිළිබඳව එම යෝජනාවේ මා සඳහන් කර තිබුණා. අපට හැකි පමණින් විවිධ වැඩ සටහන් සිදු කරනවා. අපේ මට්ටමින් ගතයුතු ක්‍රියාමාර්ග ලබාගෙන තිබෙනවා. අදාළ ආයතන වෙත ලිපි යොමුකර තිබෙනවා. නමුත් ඒ සඳහා එම ආයතන මඟින් ලබාගත් ක්‍රියාමාර්ග මොනවාද?

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
අපගේ මෙම සමාජය වෙනුවෙන් අප කැපකිරීම් කළ යුතුයි.

<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>
දැන් සියළුම ස්ථානයන්හි "මිනි බාර්" තිබෙනවා. මත්ද්‍රව්‍ය භාවිතාව වැඩිවීම හේතුවෙන් ස්ත්‍රී දූෂණ වැනි සිද්ධීන් වැඩි වශයෙන් සිදුවෙනවා. ඊට නියමිත දඬුවම් ලබාදීමෙන් පමණයි මේවා වලක්වා ගත හැකි වන්නේ. එනිසා මේ පිළබඳව සටහන් කරමින් අදාල නිලධාරීන් වෙත ලිපි යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**තීරණඅංක 02**
**එකී කරුණ සම්බන්ධයෙන් පළාත් පොලිස් අධිකාරීවරුන් වෙත ලිපි යොමු කිරීමට තීරණය විය.**

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
මීළඟට සභාව සඳහා ලැබී ඇති ලිපි සහ පැමිණිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**
යොමු කරන්නා - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය
විෂය - පළාත් පාලන කටයුතු සඳහා පුරවැසි සහභාගීත්වය ඉහළ නැංවීම පිළිබඳ අවබෝධතා ගිවිසුම

**තීරණඅංක 03**
**පළාත් පාලන කටයුතු සඳහා පුරවැසි සහභාගීත්වය ඉහළ නැංවීම පිළිබඳ අවබෝධතා ගිවිසුම අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සභාව ඒකමතිකව තීරණය කරන ලදී.**

**ලිපි අංක 02**
යොමු කරන්නා - ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා
විෂය - 2022.06.13 දින සභා රැස්වීම සම්බන්ධව නිඩාඩු ලිපිය

**ලිපි අංක 03**
යොමු කරන්නා - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
විෂය - මාර්තු මස සභා වාර්තා නිරීක්ෂණ ලිපිය

**ලිපි අංක 04**
යොමු කරන්නා - විෂය ලිපිකරු - මස්කෙළිය ප්‍රාදේශීය සභාව
විෂය - RF – 7744 අංක දරණ ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියාව පිළබඳ වූ ලිපිය

**තීරණඅංක 04**
ඉහත ලිපියට අනුව තාක්ෂණික කමිටුවේ නිර්දේශය ලබාගත් පසුව ට්‍රැක්ටර් රථය අළුත්වැඩියා කිරීම සඳහා සභාව ඒකමතිකව අනුමැතිය ලබාදෙන ලදී.

ලිපි අංක 05
යොමු කරන්නා - විෂය ලිපිකරු, මස්කෙළිය ප්‍රාදේශීය සභාව
විෂය - ආයුර්වේද රෝහලේ සුළු අලුත්වැඩියාව සිදුකිරීම සඳහා වූ අනුමත මිල ගණන්

<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>
ප්‍රධාන වීදියේ පිහිටා ඇති වැසිකිළි පද්ධතියේ දැනට පවතින තත්වය කුමක්ද? ඒ අසල ජීවත්වන සමහර පවුල්වල සාමාජිකයිනුත් එම වැසිකිළිය තමයි භාවිතා කරන්නේ. පවුල් දෙකක් එම වැසිකිළි පද්ධතිය භාවිතා කරනවා. වැසිකිළි දෙකක් අලුත්වැඩියාව සඳහා E4D ආයතනයෙන් අපි ඉල්ලා තිබෙනවා. එය එම ආයතනයෙන් අළුත්වැඩියා කර දෙයි. ඒ දක්වා මෙම වැසිකිළි පද්ධතියේ දක්නට ඇති සුළු සුළු අඩුපාඩු සම්පූර්ණ කර දෙන්න.

**තීරණඅංක 05**
**මස්කෙළිය ආයුර්වේද මධ්‍යස්ථානයේ පවතින සුළු අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට සහ 2 වන වීදිය වැසිකිළි පද්ධතිය සුද්ධ පවිත්‍ර කිරීමට සභාව ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.**

<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>
ලිපි ඉදිරිපත් කිරීමේදී ගරු උප සභාපතිතුමාගේ නිඩාඩු පිළිබඳ ලිපිය ඉදිරිපත් කර තිබුණා. ගරු උප සභාපතිතුමා මෙම සභාවට නුසුදුසු කෙනෙක් බවට මම අදහස් කර සිටිනවා. එතුමාගේ ක්‍රියාකලාපය මෙම සභාවට අපහාස වන පරිදි සිදු වෙනවා. මාසික සභා රැස්වීම සඳහා එතුමා පැමිණිය යුතුයි. අද දිනට නියමිත එතුමාගේ දීමනාව දැනට අතේ තිබෙනවාද? නැද්ද? එය පමණක් පවසන්න.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
ඔව් තිබෙනවා.

<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>
සභා කටයුතු අවසන් වූ පසුව එතුමාගේ දීමනාව කියා මා හට පෙන්වන්න. එමෙන්ම එතුමා සභා රැස්වීම සඳහා කී වතාවක් පැමිණ තිබෙනවාද කියන එකත් පරීක්ෂා කර බලන්න. මීළඟ සභා රැස්වීමේදී එතුමාට විරුද්ධව අපි විශ්වාසභංග යෝජනාවක් ගෙන ඒමට සූදානම්ව සිටිනවා. ඒ සඳහා සභාවේ ගරු මන්ත්‍රීවරුන් පක්ෂව ඡන්දය ලබාදෙයි කියා බලාපොරොත්තු වෙනවා. සභා රැස්වීම සඳහා එතුමාගේ පැමිණීම ඉතාමත් අසතුටුදායක ලෙස තිබෙනවා. එවැනි උප සභාපතිවරයෙකු යටතේ කටයුතු කිරීම අපව අපහාසයට ලක් කිරීමකට හා සමාන බවයි මම දකින්නේ. එනිසා එම තනතුර සඳහා සුදුසු කෙනෙක් තෝරා පත්කර ගතයුතු බවට මම මෙම සභාවට යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>
ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමාගේ අදහසට අනුව මෙය ගරුත්වයක් හිමි සභාවක්. ඔබතුමිය නිල නොවන මහේස්ත්‍රාත්වරියක්. එනිසා ඔබතුමියගේ ආසනය සඳහා සුදුසු, එසේ නැතිනම් සමාන කෙනෙක් උප සභාපති විය යුතුයි. මෙතුමා සඳහා කාර්යාලයේ විශාල ස්ථානයක් වෙන්කර දී තිබෙනවා. ආසනයකුත් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා පවසන පරිදි එතුමා කී වතාවක් සභාවට පැමිණ තිබෙනවාද? එම ආසනයේ සිට ජනතාවගේ ප්‍රශ්න කොපමණක් විසඳා තිබෙනවාද? පසුගිය සභා වාරයේදී එක්තරා වෙනස් පාටකින් යුත් ඇඳුමක් ඇඳ පැමිණ සිටියා. මේ සියල්ල සභාව අපහාස කරන බවටයි අපි දකින්නේ. සභාවේ අවශ්‍යතාවය මත සහ ස්ථානයේ අවශ්‍යතාවය මත නිලධාරීන් සඳහා උප සභාපතිතුමාට වෙන්කර ඇති කාමරය ලබාදීම සඳහා තීරණයක් ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**

මීට පෙරත් එම කාමරය කාර්යාලයේ අවශ්‍යතාවය මත ලබාගන්නා ලෙස අපි පවසා සිටියා. කාර්යාල කාමරය වසා තැබීමෙන් ඇති ප්‍රයෝජනයක් නැහැ.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

එම ස්ථානය කාර්යාල කටයුතු සඳහා ලබා ගැනීමට සභාවට බලයක් තිබනවා ද යන්න නැවත පරීක්ෂාකර බලා නිවරැදි තීරණයක් ලබා ගන්න.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

සභාවට ඇති බලතල භාවිතා කරමින් සභාවේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනා එක්ව ඒකමතිකව තීරණයක් ලබා ගතහොත් අනිවාර්යයෙන්ම එය සිදු කළ හැකියි.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

ගරු සභාපතිතුමියණි, මෙම කාරණාව පිළිබඳව අපි යම්තාක් දුරට පරීක්ෂාකාරීව තීරණයක් ලබාගත යුතුයි. හේතුව දැනටමත් එතුමා මෙම සභාවේ උප සභාපති. එතුමාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් කර එම යෝජනාව වැඩි ජන්ද ප්‍රමාණයකින් තහවුරු කල පසුවයි එතුමාගේ තනතුරට වෙනත් කෙනෙක් පත් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත දැනුම් දිය හැක්කේ. ඉන් අනතුරුව ගරු ආණ්ඩුකාරතුමා තීරණයක් ලබාගෙන අපව දැනුවත් කරයි. ඉන්පසුව තෝරාගන්නා උප සභාපතිතුමා ක්‍රියාකාරී මන්ත්‍රීවරයෙකු නම් ඔහුට අනිවාර්යයෙන්ම කාර්යාලයේ ස්ථානයක් අවශ්‍යයි. එනිසා මේ පිළිබඳව හොඳින් සොයා බලා කටයුතු කළ යුතුයි. සභාව ආරම්භ කළ දිනයේ සිට මේ දක්වා සභා වාර කොපමණ ප්‍රමාණයයක් සඳහා එතුමා පැමිණ තිබෙනවාද කියන විස්තර අවශ්‍යයි.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

සභාවෙන් මෙවැනි තීරණයක් ලබාගෙන ඇති බවට කොමසාරිස්තුමා වෙත යොමු කරන්න.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

මීළඟට මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා සභාවට ඉදිරිපත් කිරීම සිදුකරන්න.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

මුදල් කමිටු වාර්තාවේ කාරණා අංක 02 ට අනුව කාර්යාලය සඳහා වූ CCTV කැමරා මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබෙනවා. මෙය වහාම මිලදීගෙන සවි කිරීමේ අවශ්‍යතාවයක් තිබෙනවා. මේ සඳහා ප්‍රතිපාදන තිබෙනවාද යන්න මූලික කර ගනිමින් ඒ සඳහා වූ තීරණයක් ලබා දෙන්න. දැනට මේවා මිලදී ගැනීම සඳහා වූ ආර්ථික තත්වයක් තිබේද යන්න පැහැදිලි කරන්න.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

දැනට කාර්යාලය සඳහා අවශ්‍ය නිරීක්ෂණ කැමරා පද්ධතියක් සවි කිරීමේ අවශ්‍යතාවයක් තිබෙනවා. එනිසා තමයි මිල ගණන් කැඳවීම සිදුකළේ.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

රටතුල පවතින ආර්ථික තත්වය පිළිබඳව විවිධ මතිමතාන්දර තිබෙනවා. ගරු මන්ත්‍රීවරුන් සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබාගැනීමේ හිඟයක්ද පවතිනවා. අතිකාල දීමනා ගෙවීම් පිළිබඳව ද අපි යම් තීරණ ලබාගෙන තිබෙනවා. ඒ වගේම ලක්ෂ දෙකක් පමණ වියදම් කර CCTV කැමරාවක් සවිකළ යුතු අවශ්‍යතාවය පිළිබඳව සොයා බැලිය යුතුයි. මෙම ගරු සභාවෙන් රටතුල පවතින ආර්ථික තත්වය සැලකිල්ලට ගනිමින් තීරණයක් ලබා ගන්නේ නම් මේ සඳහා අවශ්‍ය සම්පූර්ණ සහයෝගය නොමැති අවස්ථාවක, ඒ සඳහා වූ අවශ්‍යතාවයක් තිබේද යන්න මා දන්නේ නැහැ. සභාව තුල දැන් හදිසියේ යම් කාරණා සිදුවෙමින් පවතිනවා. සභාව තුල නිතරම සාකච්ඡාවට ලක් වූ වැන් රථගාල පිළිබඳ ලියාපදිංචිය වුවද සීඝ්‍රයෙන් සිදුවෙමින් පවතිනවා. ගාස්තු ගෙවනු ලබනවා. එවැනි ආදායම් මාර්ග සොයා බලා ආදායම් ලබා ගැනීම සුදුසු බව සඳහන් කර සිටිනවා. අතිරේක වියදම් පිළිබඳවද සොයා බැලිය යුතුයි. සැණකෙළි වැඩසටහනින්ද ආදායම් ලැබුණු බව පවසා

සිටියා. නව යෝජනා ක්‍රම මඟින් ආදායම් උපයාගැනීම සඳහා ක්‍රම ඇත්නම් ඒ සඳහා අවධානය යොමු කරන්න. කාරණා අංක 03 යටතේ සඳහන් ගරු මන්ත්‍රීවරුන් සඳහා නිකුත් කරන මාසික සභා වාර්තා, ලිපි ලේඛන හිඟතාවය සහ මිල වැඩිවීම හේතුකොටගෙන එම වාර්තා අදාළ එක් භාෂාවකින් පමණක් නිකුත් කිරීමට සහ අනෙකුත් වාර්තා අන්තර් ජාලය ඔස්සේ යොමු කිරීමට තීරණය කර තිබෙනවා. අපට දෙමළ භාෂාවෙන් ලබාදීම පිළිබඳව ඇත්තටම ස්තූතියි. නමුත් මෙහි සුළු ගැළුවක් තිබෙනවා. සහෝදර භාෂාවෙන් මම කතා කරන කරුණු අඩංගු වී ඇති බව කොහොමද දැනගන්නේ? සමහර රාජ්‍ය නොවන ආයතන පවත්වන සියලුම සම්මන්ත්‍රණ සඳහා අපි සහභාගී වෙනවා. එහි ලිපි ලේඛන පිළිබඳව කිසි ගැටළුවක් නැහැ. සියලුම ලිපි ලේඛන ලබා දෙනවා. එනිසා මේවා ලිපි ලේඛන වශයෙන් ලබාදීමට යමක් සිදු කරන්නම වෙනවා. මේ පිළිබඳවත් අවධානය යොමු කරන්න. මුදල් කමිටුවෙන් ලබාගන්නා ලද නිර්දේශ සියල්ලලටම තීරණයක් ලබාගෙන සභා වාර්තාවේ අවසන් පිටුවේ සඳහන් කර තිබෙනවා. මේවා යෝජනා කළේ කවුද? සපීර කළේ කවුද? යන විස්තර කිසිවක් නැහැ. මේවා යොමුකර ක්‍රියාත්මක කිරීමට සිදු වෙනවා. මේ දිනවල සියලුම රජයේ නිලධාරීන් ගෙවතු වගාවක් සිදු කළ යුතු බවට ප්‍රකාශ කර තිබෙන මේ අවස්ථාවේ අපේ නිලධාරීන් CCTV කැමරා සවිකිරීම, ලිපි ලේඛන භාවිතාව අඩු කිරීම වැනි යෝජනා ඉදිරිපත් කිරීම වෙනුවට වෙනත් යෝජනා ඉදිරිපත් කිරීම වඩාත් සුදුසුයි.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
ගරු මන්ත්‍රීතුමනි. CCTV කැමරා පද්ධතිය දැනට සවිකළ යුතු එකක්. මුදල් කමිටු සමාජිකයින් එම නිර්දේශ ලබා දී තිබුණා. වගා කිරීමේ කටයුතු අපගේ සභාවේ දැනට ආරම්භ කර තිබෙනවා. මුදල් කමිටු සාමාජිකයින් මේ පිළිබඳව සාකච්ඡා නොකර නිර්දේශයක් ලබා දුන්නේ නැහැ. විවිධ තර්ක විතර්ක ඉදිරිපත් කරීමෙන් අනතුරුවයි නිර්දේශ ලබා දෙන්නේ. මෙහිදී කතා කරන නිසා සියලුම මන්ත්‍රීවරුන් මුදල් කමිටුවට සම්බන්ධ කර ගන්නා ලෙසට ඉල්ලීමේ අවස්ථාවක් මතු වෙනවා. සමහරුන් කමිටු පත් කිරීමේදී කිසිම කමිටුවක සාමාජිකයෙක් වීමට අකැමති බවට ප්‍රකාශ කළා. දැනට සිටින සාමාජිකයින් සියලුදෙනා සියලුම රැස්වීම් වලට සහභාගී වෙනවා. එනිසා මුදල් කමිටුවෙන් ලබාගන්නා නිර්දේශ ප්‍රතික්ෂේප කිරීමෙන් ගැටළු මතු වෙනවා.

<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (ඒ.ජා.ප)</u>
මේ හේතුව නිසා තමයි මුදල් කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන්න එපා කියලා මා කියා සිටියේ.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
පෞද්ගලිකව එක් මන්ත්‍රීවරයෙක් නිසා සභාවට ඉදිරිපත් නොකර ඉන්න බැහැ.

<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (ඒ.ජා.ප)</u>
මට මෙය ගැටළුවක්. මුදල් කමිටුවේ සාමාජිකයින්ට මම චෝදනා කළේ නැහැ. මෙම කාරණාව සුදුසුයි නම් ක්‍රියාත්මක කරන්න කියලයි මම කියා සිටියේ. මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලද කාරණාවක් සභාවට ඉදිරිපත් කර තීරණයක් ලබා ගත යුතුයි. සභාවට ඉදිරිපත් කළොත් අපට කතා කරන්න වෙනවා නේද? එසේ නොමැති නම් සභාවට ඉදිරිපත් කරන්න එපා. අනෙකුත් මන්ත්‍රීවරුන්ද මේ සඳහා කැමැත්ත ප්‍රකාශ කරයි.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
සභාවේ සාකච්ඡා කරන සියලුම කරුණු වලට විරෝධය පලකර සිටි විට සභාවේ කිසිදු කටයුත්තක් සිදු කරන්න බැහැ.

<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (ඒ.ජා.ප)</u>
එසේනම් මෙය අනවශ්‍ය දෙයක් ලෙස සලකා ඉරා දමා ගියානම් හරි.

(මුදල් කමිටු වාර්තාව පිළිබඳව සභාවේ තර්ක විතර්ක සිදුවූ අවස්ථාවේදී ගරු මන්ත්‍රී_කේ.සුරේෂ්කුමාර් මැතිතුමා විසින් මුදල් කමිටු වාර්තාව ඉරා දමන ලදී.)

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

සභාව තුළ විනයානුකූලව කටයුතු කරන්න. සභාවට ඉදිරිපත් කරන කරුණු කිහිපයක් සඳහාම ඔබ විසින් බාධා ඇති කරනු ලැබුවා.

**මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

අපි බාධා ඇති කළේ නැහැ. කරුණු පැහැදිලි කළා.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**

මුදල් කමිටුවේ දී අප විසින් ලබාගන්නා ලද සියලුම තීරණ සුදුසු නැහැ කියා පවසනවා නම් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී ගරු කේ.රාජ්කුමාර් මැතිතුමා විසිනුත් කාර්යාලයේ CCTV කැමරාවක් සවිකිරීමට අවශ්‍ය බව පවසා තිබෙන්නේ හේතුවක් නොමැතිව නෙවෙයි.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

මෙම තත්වය පිළිබඳව අවබෝධ කරගනිමින් තමයි තීරණයක් ලබා ගන්නා ලෙස මා පවසන්නේ. වෙන හේතුවක් නිසා කියා සිටියේ නැහැ.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**

එවැනි නොගැලපෙන මුදල් කමිටු සාමාජිකයන් සිටිනවා නම් ඔබතුමා පත්කර මෙය කරන්න.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

මම පැහැදිලිව කියා සිටියා. සිංහල මන්ත්‍රීවරුන් තිදෙනෙක් සිටින නිසා සිංහල භාෂාවෙන්ද මා මේ ගැන පැවසිය යුතුයි. මම පැහැදිලි කර සිටියේ දැනට රටතුල පවතින ආර්ථික තත්වය සමඟ CCTV කැමරා සවිකළ යුතුද? නැද්ද? යන තීරණය සභාව හැටියට ලබාගන්න. ඒ සඳහා මන්ත්‍රී හැටියට මාගේ පෞද්ගලික විරෝධතාවය පලකර සිටින බවයි මා පවසා සිටියේ. එයට ඔබතුමිය, මුදල් කමිටුවට මම චෝදනා කර සිටියා කියා පැවසුවත් ඒ අයට මම චෝදනා කර සිටියේ නැහැ. මගේ මොළයට දන්න නිසා ඒ ගැන කතාකර පැහැදිලි කළ යුතුයි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

මේ අවස්ථාවේ පමණක් නෙවෙයි, සියලුම මුදල් කමිටු තීරණ සඳහා මේ ආකාරයයි.මෙහි තිබෙන හැම දෙයක්ම වැරදි කියා පවසා සිටින්නේ. කතා කිරීමට අවශ්‍ය දේ දැන සභාවට පැමිණෙන්න.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

සභාවට ඉදිරිපත් කර ඒ සඳහා තීන්දු තීරණ ලබාගෙන තිබෙනවා නම්, මෙම කාරණාව සභාවට යොමු කිරීම අවශ්‍ය නොමැති නම් ඇයි මෙලෙස කළේ. මෙම විෂය පිළිබඳව කතා කිරීම වැරදියි කියා මම පවසා සිටියේ නැහැ. මෙයට සවන් දී බලන්න, ඔබතුමියගේ මවු භාෂාවෙන්ම මම කියා තිබෙනවා. මේ සම්බන්ධයෙන් පමණයි මම කතා කළේ. මෙය වෙනත් ආකාරයකට ගෙන යන්න එපා.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

මෙම කාරණාව ගැටළුවක් කරගන්න එපා. පසුගිය මුදල් කමිටු රැස්වීමේදී ලබා ගන්නා ලද තීරණයට අපිත් සහයෝගය ලබා දුන්නා. එනිසා තමයි මෙවර මිල ගණන් කැඳවීම පිළිබඳව කරුණු ඉදිරිපත් කළේ. එතුමා පවසා සිටියේ දැනට පවතින තත්වය මත මෙය ගැලපෙනවාද? යන්න හා මෙම ප්‍රතිපාදන යොදා ගනිමින් වෙනත් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීමේ යෝජනාවකුයි එතුමා ඉදිරිපත් කළේ. මෙය පිළිගන්නවා නම් පිළිගන්න. නැතිනම් නොපිළිගන්න බවට ප්‍රකාශ කරමු. මෙම ප්‍රතිපාදනය වුවත් ගරු මන්ත්‍රීවරුන්ට වෙන් කරන ලද ප්‍රතිපාදන වලටම බෙදා දිය හැකියි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

නැහැ, දැනට CCTV කැමරා පද්ධති සවි කිරීමේ අත්‍යාවශ්‍ය බවක් උදාවී තිබෙනවා.

ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)
එය මට තේරෙනවා, මෙය එපා කියා මමත් කියන්නේ නැහැ. මෙම කාරණාව ටිකක් ප්‍රමාද කර මෙම ප්‍රතිපාදන වලින් වෙනත් කුමක් හෝ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. නැතිනම් එම මුදල මන්ත්‍රීවරුන් 06 දෙනාට වෙන් කරන ලද ප්‍රතිපාදන වලට ලබා දෙන්න. CCTV යන කාරණාව අපි සභාවේ සිට එළියට ගියත් යොදාගත හැකියි.

ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)
මන්ත්‍රීවරුන් සඳහා වූ ප්‍රතිපාදන ලබා දෙන්නම් කියලනේ අපි කියන්නේ.

ගරු මන්ත්‍රී එස්.ජී.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)
සභාවක් වුණාම පක්ෂව හා විපක්ෂව කණ්ඩායම් සිටිනවා. ඒ අය චෝදනා කරයි. රටතුල ආර්ථිකය පිළිබඳව කතා කරයි. සභාවේ ආර්ථිකය පිළබඳවත් කතා කරයි. නමුත් මේවා ක්‍රියාත්මක කළ යුත්තේ ඔබතුමියයි. ඒ අය විවාද කළා කියා වැඩක් නැහැ. බහුතරයක් සිටිනවා නම් බහුතරයේ අනුමැතියත් සමඟ එම කාරණා සම්මත කරගෙන එහි වැඩකටයුතු ඉදිරියට කරගෙන යායුතුයි. එයයි සිදුවිය යුත්තේ. අනෙක් කාරණය කාර්යාලය සඳහා CCTV කැමරා සවිකළ යුතුනම් මුදල් කමිටුවෙන් ඒ සඳහා අනුමැතියද ලබා දී තිබෙනවා නම්, එම කාරණය සභාවේ යෝජනා වී ඇත්නම්, එයට විපක්ෂව සිටියත් ඒවා සම්මත කරගෙන ඉදිරියට කරගෙන යන්න. අනිවාර්යයෙන් විපක්ෂයෙන් විරෝධතා ඉදිරිපත් කර සිටිනවා.
එපමණක් නොවෙයි, සභාවට CCTV අවශ්‍ය නම් එය ලබාගන්න. මම දිගින් දිගටම මස්කෙළිය පොදු ක්‍රීඩාංගනයේ විදුලි ආලෝකය සම්බන්ධව කිහිප වතාවක්ම සභාවේදී කතාකර සිටියා. ඒ සඳහා වරලත් ඉංජිනේරුවරයෙකු අවශ්‍ය බව පවසා සිටියා. පසුගිය සැණකෙළි සංදර්ශනය පැවැත් වූ දිනයේදී, එම සංදර්ශනය සඳහා එකී ස්ථානයට විදුලිය ලබාදීමේදී සියළු විදුලි ලාම්පු දැවී ගොස් තිබුණා. මජනතාවගේ මුදල් නිවැරදිව පරිහරණය නොකරන්නේ නම් එම මුදල් විනාශ වී යනවා. ලක්ෂ 50 ක් වියදම් කර එයින් කිසි ප්‍රයෝජනයක් නැහැ. එනිසා එවැනි කටයුතු සඳහාත් වරලත් ඉංජිනේරුවරයෙකු ලබා දෙන්න කියා ඉල්ලීමක් කර ඉන් අනතුරුව ඒ දෙය ලබාදිය නොහැකිද? 150000 කින් විදුලිය ලබාගත හැකියි කියා වාර්තාවක් ලබාදී තිබෙනවා. දැනට අවුරුදු 04 ක් ගතවී ඇතත් මේවන තෙක් එය ලබා දී නැහැ. අපි ඒ අසලින් ගමන් කරද්දී , “මෙම විදුලි ලාම්පු සියල්ල දැවී ගොස්, මේ සඳහා වැයකළ මුදල් අපරාදේ, මේ සඳහා සභාවේදී කරුණු සාකච්ඡාකර සිටින්නේ නැතිද?” කියා ක්‍රීඩකයින් නිතරම ප්‍රශ්න කර සිටිනවා. එනිසා මෙවැනි කටයුතුත් කරන්න. එකම දේ පිටුපස යන්න එපා. ජනතාව අතර සභාවේ යම්කිසි හොඳ දේ මෙන්ම නරක දේද තිබෙනවා. එනිසා එවැනි දේ සඳහාද අවධානය යොමු කරන්න කියා මම ගරු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා. මම දිගින් දිගටම ඔබතුමාට ඒ පිළිබඳව පවසා සිටියා. එය දැන් අපරාධයකට ලක්වී තිබෙන්නේ. එය පරීක්ෂා කර නවීකරණය කරන්න බලන්න.

ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)
භාණ්ඩ මිලදී ගන්නා අවස්ථාවේදී අපි එක්කරා වෙළඳ නියෝජිතයෙකු තෝරාගනු ලබනවා. භාණ්ඩවල යම් පළුදු වීමක් සිදු වුවහොත් ඒ සඳහා වගකීම් සහතිකයක් තිබෙනවා නේද? අප විසින් සවිකල වීදි ලාම්පුද එලෙසමයි නේද? දැනට අප විසින් සවිකර ඇති වීදි ලාම්පු පිළිබඳව කිසිම කතාවක් නැහැ. පසුගිය සභා වාරයේදී ද මේ පිළිබඳව අපි විමසා සිටි අවස්ථාවේදී ඒ සඳහා වූ භාණ්ඩ සඳහා යවා තිබෙන නමුත් මෙතෙක් එම භාණ්ඩ ලැබී නොමැති බව ලේකම්තුමා පැවසුවා. බොහෝ ස්ථානවල වීදි ලාම්පු පළුදු වී තිබෙනවා. අදාල සමාගම සමග ඇතිකර ගත් ගිවිසුමක් ඇති නේද? CCTV කැමරාවටත් එලෙසමයි. යම් සමාගමක් සමග ඔබලා ගිවිසුමක් ඇතිකර ගනී. එවැනි අවස්ථාවකදී CCTV කැමරාවටත් යම්කිසි පළුදුවීමක් සිදු වුවහොත් ඒ අය අළුත්වැඩියා කරදෙයි කියා කොහොමද විශ්වාස කරන්නේ?.

ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)
CCTV කැමරාව සඳහා අවුරුදු දෙකක වගකීම් සහතිකයක් තිබෙනවා. වීදි ලාම්පු සඳහා අවුරුද්දක වගකීමක් පමණයි තිබෙන්නේ. අවුරුද්දක් ගත වූවායින් පසුව තමයි ඒවා පළුදු වූයේ. අපි ඒ අයගෙන් නැවතත් විමසලා තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙවැනි වැඩසටහන් ඉක්මණින් අවසන් කර දෙන්න. මහජනතාව ප්‍රශ්න කරන අවස්ථාවේදී අපි උත්තර ලබාදිය යුතුයි නේද? ක්‍රීඩා පිටියේ පොදු වැසිකිළි පද්ධතියක් ඉදි කරන අවස්ථාවේදී මම කියා සිටියා නඩත්තුව නිසි ලෙස කරන්න කියා. එයත් නිසි අයුරින් නඩත්තු කරන්නේ නැහැ. එය ඉතාමත් අපිරිසිදු තත්වයෙන් තිබෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
දින හතර පහකට පෙර නේද, එම ස්ථානයට ගොස් මා ළග සිටින අවස්ථාවේදීම එම වැසිකිළිය පවිත්‍ර කරන්න කියා පවසා සිටියේ.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මේවා අපට කළහැකි දේවල් නේද? වහාම මේවා ඉටු කරන්න.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මුදල් කමිටු වාර්තාව නිවැරදි බවට මා යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම යෝජනාව මා ස්ථිර කරමි.

**<u>2022.06.06 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව නිර්දේශයෙන් පසු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.</u>**

**කාරණා අංක 01**
කාර්යාලයේ CCTV කැමරා සවි කිරීම සඳහා මිල ගණන් විවෘත කරන ලදී.

| | Company | Amount | Brand |
|---|---|---|---|
| 1 | DataLog Information systems (Pvt) Ltd | 304400.00 | Dahua |
| 2 | PC solutions | 294600.00 | Hikvision |
| 3 | Computerage | 313100.00 | Dahua |

**තීරණ අංක 06**
**මෙම CCTV කැමරා PC solution ආයතනයෙන් මිලදී ගැනීමට මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.**

**කාරණා අංක 02**
ලිපි ද්‍රව්‍ය භාවිතා කිරීම සම්බන්ධව විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කළ ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 07**
**ඉහත ලිපියට අනුව උක්ත කරුණ සම්බන්ධයෙන් ලිපි ද්‍රව්‍ය නොමැතිකම හා හිඟකම නිසා මහ සභා වාර්තාව ඒ ඒ මන්ත්‍රීවරුන් සඳහා අදාල භාෂාවෙන් පමණක් සභා වාර්තාව ලබා දීමටත්, සභා වාර්ථාව භාෂා දෙකෙන්ම මන්ත්‍රීවරුන් හට වට්ස්ඇප් මගින් යැවීමටත්, සභා වාර්ථාව භාෂා දෙකෙන්ම කාර්යාලීය වෙබ් පිටුවේ පල කිරීමටත්, ලිපි යැවීමේදී අන්තර් ජාලය මඟින් යැවීමටත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.**

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මීළඟට ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මස්කෙළිය නගරයේ පිහිටා ඇති ප්‍රීමා නියෝජිත ආයතනය සම්බන්ධවයි මාගේ පළමු යෝජනාවයි. මස්කෙළිය නගරයේ වෙළඳ ප්‍රජාව පාරිභෝගිකයින්ව විශාල අසීරු තාවයකට පත් කරමින් සිටිනවා. රට පත්ව ඇති අසාමාන්‍ය තත්වය තුළ මහ ජනතාව විශාල ආර්ථික අර්බුදධයකට මුහුණ දෙමින් සිටිනවා. පසුගිය 19 වැනි දින මධ්‍යම රාත්‍රියේ සිට ප්‍රීමා පිටි වල මිල රුපියල් 45.00 කින් වැඩි කරනු ලැබුවා. එනිසා මස්කෙළිය නගරයේ පිහිටි ප්‍රීමා පිටි නියෝජිතයා 16 සහ 17 යන දිනවල කිසිම ව්‍යාපාරික ස්ථානයක් සඳහා තිරිඟු පිටි බෙදා හැරියේ නැහැ. වෙළඳසැල්වල පිටි නැහැ කියා කීවා. වෙළඳ හිමියන් විසින් සොයා බලන අවස්ථාවේදී එකී ප්‍රීමා පිටි නියෝජිතයා කිසිම වෙළඳසැලක් සඳහා පිටි බෙදා හැර තිබුණේ නැහැ. මධ්‍යම රාත්‍රී 12.00 ට පිටිවල මිල රුපියල් 45.00 කින් වැඩි කළ පසු, උදෑසන සියලුම කඩවල් සඳහා පිටි බෙදාහැරියා. මේ පිළිබඳව මස්කෙළිය නගරයේ පිහිටි සියලුම වෙළඳ ස්ථානවල හිමිකරුවන් අත්සන් කර ලිපියක් ලබාදී තිබෙනවා. දැනටමත් එකී නියෝජිතයා තමාගේ ගබඩාවේ මිටි 500ක් 1000ක් පමණ සඟවා තබාගෙන තිබෙනවා. මෙහිදී විවිධ සේවා සමුපකාර සමිතිය, ඉන්ධන පිරවුම් හල, ග්‍රාමසේවා නිලධාරී, පොලිස් ස්ථානය වැනි සියලුම ආයතන සභාවට සම්බන්ධ කරගනිමින් කටයුතු නොකිරීම විශාල ගැටලුවක් වී තිබෙනවා. මහජනතාවගේ ප්‍රශ්න පිළිබඳව කතා කිරීම සඳහා සභාවට බලයක් තිබෙනවා. එනිසයි මහජනතාව අපට ඡන්දය ලබා දී මෙහි එවා තිබෙන්නේ. පළමුව මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනා එක් වී එකී ප්‍රීමා නියෝජිත ආයතනයට විරුද්ධව, ඔහු මේ සඳහා නුසුදුසු පුද්ගලයෙක් බවට තීරණයක් ලබාගෙන එය යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි. සභාවෙහි බලය කුමක්ද කියා මහ ජනතාව ඉදිරියේ පෙන්විය යුතුයි.

මෙම ත්‍රීරෝද රථ ටිකද එලෙසමයි. මෙම ත්‍රීරෝද රථ ටික අපි අත්‍යාවශ්‍ය සේවාවක් වශයෙන් භාවිතා කරනවා. දැනට පෙට්‍රල් මිලද වැඩි වෙමින් පවතිනවා. සභාව මගින් මේ අය සඳහා කාරුණික ඉල්ලීමක් යොමු කළ යුතුයි. කෙටි දුරක් සඳහා වැඩි ගාස්තුවක් අයකරනවා. එනිසා ඒ අය ගෙන්වා සාකච්ඡා කර සාධාරණ ගාස්තුවක් අයකරන ලෙස ඉල්ලීමක් සිදු කළ යුතු බවට ඉල්ලා සිටිනවා.

තවත් කාරණාවක් තමයි භූමිතෙල්. අද අපි ඉන්ධන පිරවුම්හල් වල පෝලිමේ සිටිනවා. විවිධ සේවා සමුපකාර සමිතිය මගින් භූමිතෙල් විකුණනු ලබනවා. භූමිතෙල් පෝලිමේ සිට අවසානයේදී භූමිතෙල් ලබාගත නොහැකිව හිස් අතින් ගිය බොහෝ දෙනෙක් සිටිනවා. මෙම භූමිලෙත් ටික සමහර වෙළඳසැල් වල ලීටරයක් රු.300.00 කට විකුණනු ලබනවා. අද දින පරීක්ෂා කළහොත් ලිටර් 100 ක් පමණ බැලිය හැකියි. ගෑස් ද එලෙසමයි. ගෑස් සහ භූමිතෙල් මේ අය සඳහා ලැබෙන්නේ කොහොමද? එකී වෙළඳසැලේ භාණ්ඩ මිළදී ගන්නා අය සඳහා පමණක් මේවා ලබාදෙනු ලබනවා. මෑතකදී තිරිඟු පිටි ගෙන ආ පුද්ගලයෙකු පිළිබඳව සමාජ මාධ්‍යවල සඳහන් වී තිබුණා. වතු කම්කරුවන් සඳහා රු.90.00 වැනි සහන මිළකට ලබාදෙන පිටි රැගෙන ඒම සඳහායි ඔහුට විශාල මුදලක් ලබා දී තිබුණේ. මෙම පිටි ටික රැගෙන විත් වැඩි මිළකට විකිණීමයි ඔවුන්ගේ අරමුණ. මේ සියල්ල මා විසින් පැවසීමට හේතු වූයේ සභාව මගින් මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස්කළ යුතු නිසයි. ග්‍රාමසේවා නිලධාරීන්, පොලීසිය, විවිධ සේවා සමුපකාර කළමණාකරු, ගෑස් නියෝජිතයින් වැනි සියළු දෙනාම ගෙන්වා අංක ලබාදීමේ ක්‍රමයක් හඳුන්වා දෙන්න. නැතිනම් මහජනතාව විශාල අර්බුධයකට මුහුණ දෙනු ලබනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු මන්ත්‍රීතුමා පවසන කරුණු පිළිබඳව අපි විශ්වාස කරනවා. එකම එක නියෝජිතයෙක් පමණක් ලබාදීම නිසා තමයි මෙම ගැටළුව මතුවන්නේ. මෙය නියෝජිතයින් තිදෙනෙක් සඳහා ලබාදිය හැකියි නේද? එවැනි අවස්ථාවකදී එක්තරා ක්‍රමවේදයක් සාදාගත හැකියි. මම වෙළඳ මහතෙක්. නමුත් මාගෙන් හතර දෙනෙක්වත් භාණ්ඩ මිලදී ගතහොත් පමණයි මම වෙළඳ මහතෙකු වන්නේ, මාගෙන් මිලදී නොගතහොත් මම වෙළඳ මහතෙකු නොවෙයි. වැඩි භාණ්ඩ තොගයක් වැඩි මිලකට විකුණනවා. හාල් වෙළදාමද එලෙසමයි. මේ සියල්ල සඳහා පාරිභෝගික අධිකාරිය කිසිම ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. ජනතාවගේ ආදායම වැඩි කර, භාණ්ඩවල මිලත් වැඩි කළා නම් කමක් නැහැ. ජනතාවගේ ආදායම එතනමයි. වැඩිකර නැහැ. මීළඟ කාරණාව තමයි ක්‍රමවේදයක් සකස්කළ යුතුයි කියන එක. පළමුව අංක ලබා දුන්නා, සති දෙකකට පසුව භූමිතෙල් ලැබුණු වහාම අංක කිසිවක් නැහැ. සියලු දෙනාටම ලබා දුන්නා. එසේනම් කුමක්ද ක්‍රමවේදය? ඈත දුර ප්‍රදේශවල වල සිටින ජනතාව ඇත්තටම පවු. රුපියල් 300.00 කට මිලදී ගැනීම සඳහා රුපියල් 400.00 ක් වියදම් කර පැමිණිය යුතු තත්වයක් උදාවී තිබෙනවා. ගෑස් ටිකත් එලෙසමයි. මස්කෙළියට ගෑස් එනව දන්නෙත් නැහැ, යනව දන්නෙත් නැහැ. මස්කෙළිය නගරයේ කුමන හෝ වෙළඳ මහතෙක් පෝලිමේ සිටිනවා දැක තිබෙනවාද? මස්කෙළිය නගරයෙන් රුපියල් 5000.00 කට ගෑස් මිලදී ගෙන හැටන්වලට රැගෙන ගොස් රුපියල් 8000.00 කට විකුණනු ලබනවා. අපි ග්‍රාම නිලධාරි මහතාට උදව් කරමු. ජන්ද නාම ලේඛනය අනුව අංක ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කරමු. ඩීසල් ලබාදීමේදීත් මෙම ගැටළුව තිබෙනවා. සභාවේ වැඩ කරන සේවකයන් මුලු දවසම භූමිතෙල් පෝලිමේ සිටියහොත් නගරය පවිත්‍ර කරන්න බැරි වී

නගරය ඉතාමත් අපවිත්‍ර තත්වයකට පත්වෙයි. එනිසා ගරු මන්ත්‍රීවරයෙකු ඒ අයට ලීටර් 10 ක් ලබාදෙන්න කියා ඉල්ලීමක් කර සභාවෙන් සාකච්ඡා කර, සමූපකාර සමිති සභාපතිතුමා වෙත , ලිපියක් සකස්කර ඉදිරිපත් කරන්න. ඉන්ධන පිරවුම්හල වෙත ගියපසු දෙන්න බැහැ කියා පවසනවා. සේවකයින් පවු නේද? තවද ජනතාවගේ ආරක්ෂාව සඳහා යම් වැඩ පිළිවෙළක් සකස් කල යුතුයි. එනිසා මේ පිළිබඳව සාකච්ඡාවක් සංවිධානය කර, එක් එක් කාරණා සම්බන්ධයෙන් වෙන් වෙන්ව තීරණ ලබා ගන්න. මෑතකදී අවුරුදු 14 ක පිරිමි දරුවකු ගසකින් වැටී මරණයට පත් වුවා. එයට හේතුව මෙය වෙන්නත් ඇති කියා මට සිතුණා.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)</u>

මස්කෙළියේ වෙළඳ මහතුන් විසින් පැරණි මිළට තිබූ භාණ්ඩවල මිළ මකා දමා අළුත් මිළට මේවා විකුණනු ලබනවා. මේ පිළිබඳව බොහෝ චෝදනා පැමිණෙනවා. සභාවතුලදී මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කර ඔබලාට මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග ලබාගත හැකිද? කියා විමසා සිටිනවා. සභාපතිතුමිය හා ගරු මන්ත්‍රීවරුන් සවන්දී සිටින මේ මොහොතේදී මුලින්ම මා විමසා සිටිනවා මෙලෙස නීතිමය කටයුතු සිදුකිරීම සඳහා සභාවට බලය තිබෙනවාද? කියා. එසේ නොමැති නම් මෙහි කතාකර තේරුමක් නැහැ. මහජනතාවගේ නියෝජිතයෙකු ලෙස සභාව තුලදී මේ සම්බන්ධයෙන් ගතහැකි ක්‍රියාමාර්ගය කුමක්ද? පාරිභෝගික අධිකාරිය අප්කට් එකට ගොස් පරීක්ෂණ පවත්වා මස්කෙළිය නගරයට පැමිණෙන්න කියූවිට පැමිණෙන්නේ නැත්නම් එම ආයතනය මුදල් වලට යටවෙලයි තිබෙන්නේ. සභාවේ මන්ත්‍රීවරුන් ලෙස අපි ලැජ්ජාවිය යුතුයි. මහජනතාවගේ නියෝජිතයන් ලෙස අපට ප්‍රශ්න විසදාගත නොහැකි නම් කුමක්ද අපට ගතහැකි මීළඟ පියවර. එසේ නම් අපි සියළු දෙනාම මාධ්‍ය සාකච්ඡාවක් කර හෝ මේ දේ මාධ්‍යට පෙන්වා රටට එළිකල යුතුයි. එසේ නොමැතිව මෙහි අපි කතාකළාට ඒ දේට කවරෙකු හෝ ඇහුම්කන් දෙන්නේ නැත්නම්, ඒ පිළිබඳව පරීක්ෂණ කරන්නේ නැත්නම් අපි මෙහි කතා කිරීමෙන් කිසි තේරුමක් නැහැ. එසේ නම් එවැනි වැඩ පිළිවෙලක් යොදන්න. ඔබතුමියගේ නායකත්වයෙන් එය ඉටු කරමු. ඉන්පසු වෙළඳමහතුන් හිතවතුන් අමනාප වෙයි. නමුත් මේ කටයුතු ආපස්සට ගන්න එපා. මහජනතාවගේ කටයුතු සඳහා මෙතැනට පැමිණියා නම්, මහජනතාවට සේවය කරමු. ඒ අයුරින් සංවිධාන කරන්න, මාධ්‍ය සාකච්ඡාවක් කර මෙයයි සිදු වන්නේ කියා රටට හෙළිකර සිටිමු.

<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>

ගරු මන්ත්‍රීතුමාට ස්තූතියි. මෙහිදී මෙතුමා විමසා සිටිනවා මේ පිළිබඳව කටයුතු කිරීම සඳහා අපට බලයක් තිබෙවාද? කියා. එතුමා එම ප්‍රශ්නය විමසා සිටියේ බුද්ධිමත් නිසා බව මාහට වැටහෙනවා. මෙහි මහජනයාගේ නියෝජිතයෙකු ලෙස අප පත්ව සිටිනවා. මේ ප්‍රශ්න අපි තමයි කතාකළ යුත්තේ. සභාව යටතේ කොට්ඨාශ 10 ක් තිබෙනවා. මේ 10 තුල එක් එක් මන්ත්‍රීවරයා බැගින් මහජන නියෝජිතයන් ලෙස මන්ත්‍රීවරුන් පත්ව සිටිනවා. මේ ප්‍රශ්න පිළිබඳව අපි කතා නොකරනවා නම් වෙන කවුද කතා කරන්නේ. අපිට අයිතියක් තිබෙනවා කියන එක නෙවෙයි, දැන් වෙළඳ මහතුන් සියළු දෙනා අත්සන් කර ලිපියක් දී තිබෙනවා. මහා සභාවේදී කතාකර වාර්තාවට ඇතුලත් කර සිටිනවා. ඇයි අපේ සභාපතිතුමිය ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට මේ සඳහා අත්සන් කර අදාල ආයතන වෙත යොමුකළ නොහැකි වන්නේ. දේශපාලන පැත්තෙන් අපට අයිතියක් තිබෙනවා. දේශපාලඥයින් පාර්ලිමේන්තුවටද, පළාත් සභාවටද, නගර සභාවටද, ප්‍රාදේශීය සභාවටද අයිති කියා දෙයක් නැහැ. මහජන නියෝජිතයන් ලෙස අපියි පහලම සිටින්නේ. එනිසා කරුණාකර සියළුම ගරු මන්ත්‍රීවරුන් එකට එක්වී පිටි සම්බන්ධයෙන් පළමුව පටන්ගෙන මෙතැනින් එහාට අපි යමු.

මම ඉන්ධන පිරවුම්හල, විවිධ සේවා සමුපකාර යන ආයතන සඳහා විරුද්ධයි. මේ සම්බන්ධව කතා කළේ නැහැ. අපගේ කම්කරුවන් සඳහා භූමිතෙල් ටිකක් ලබාදෙන්න කියා සභාපතිතුමිය සමුපකාරයට කතා කරනවිට එතුමා පැවසුවා ලේකම්තුමා හරහා නම් ලැයිස්තුවක් සකස්කර එවන්න, එවිට මම ලබාදෙන්නම් කියා. එම ලිපිය රැගෙන ගොස් සමූපකාර සභාපතිතුමාද අත්සන් කරදුන් පසු එය ඉන්ධන පිරවුම්හලට ලබාදුන්නද අපගේ අයට භූමිතෙල් ලැබුණේ නැහැ. ඒ වන විට භූමිතෙල් තිබුණද? නැද්ද? කියන එක නෙවෙයි මෙහි ඇති ප්‍රශ්නය. අනෙක් කාරණය අපගේ ගරු මන්ත්‍රීතුමා පැය 12 ක් පමණ සිටියා. මාගේ පුතාද උදේ සිට සිටියා. එහි ගැටළුවක් නැහැ. අපි පෝලිමේ නොසිට හරස් වී ගොස් ලබා ගැනීමට අවශ්‍ය නැහැ. අපි පවසන්නේ සභාපතිතුමියට මා පැවසූ ආකාරයට මේ සඳහා ක්‍රමවේදයක් සකස් කර සිටිමු කියලයි. මෙතැනට ලීටර් 5000 ක් ගෙන ආවොත් මෙහි සිටින පිරිස ගණන් කර ටෝකන් එක ලබා දීමෙන් පසු එම අවස්ථාවේදීම මෙය ලබාදිය හැකියි. එවිට සියළු දෙනා අතරේම බෙදීයයි. මහජනතාව පවසන්නේ භූමිතෙල් ඉන්ධන පිරවුම්හලේ සඟවා තබා රහසිගතව රාත්‍රී කාලයේදී ලබාදෙන බවයි. එක් පුද්ගලයෙක් ලග භූමිතෙල්

ලීටර් 200 ක් තිබෙන්නේ කොහොමද? වෙනත් කඩයක භූමිතෙල් රුපියල් 300.00 ට විකුණන්නේ කොහොමද? මෙය ප්‍රශ්නයක් වෙනවා. ගිය වාරයේදී ඩීසල් ලීටරයක් රුපියල් 400.00 කට මා විසින් එක් අයෙකුට අරන් දී තිබෙනවා. මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට බලන්ගොඩට මෙහි සිට ගෑස් යනවා. කොළඹට, බදුල්ලට හා නුවරට මෙහි සිට භූමිතෙල් යනවා. රටේ සියළු පැති වලට මස්කෙළියෙනුයි භූමිතෙල් හා ගෑස් පිටත් වන්නේ. කොහොමද මෙහෙම යන්නේ. ඉන්ධන පිරවුම්හලිනුයි යන්නේ. ඉන්ධන පිරවුම්හලට අපි දොස් පවරන්නේ නැහැ. ඉන්ධන පිරවුම්හලින් එක් පවුලකින් 05 දෙනෙක් 20 දෙනෙක් දමා ලබාගත හැකියි. එක් වෙළඳ මහතෙකු පවසා සිටිනවා නංගිට නාවලපිටියටද, අම්මට පේරාදෙණියටද, තවත් අක්කා කෙනෙක් සඳහා පුස්සැල්ලාවටද යැවීම සඳහා හෙට දින හතරදෙනෙකු පෝලිමට යොදවන බව. හතර දෙනෙක් යොදවා එක් අයෙක් සඳහා රුපියල් 1500.00 බැගින් පඩි ගෙවා එම වෙළඳමහතා භූමිතෙල් ලබා ගන්නවා. මම ඉන්ධන පිරවුම්හලට දොස් පවරනවා නෙවෙයි. එක් පුද්ගලයෙක් ලග කොහොමද භූමිතෙල් ලීටර් 100 ක් තියෙන්නේ. ඔහු කොහොමද රුපියල් 300.00 කට විකුණන්නේ. මේ ගැන කවුද විමසන්නේ. කවුද මේවා අල්ලන්නේ. මෙය විශාල ප්‍රශ්නයක් වෙලයි තිබෙන්නේ. සභාපතිතුමිය, ගරු මන්ත්‍රීවරුන් හා මා පෝලිමේ සිටයි භූමිතෙල් ලබා ගත්තේ. රාජ්කුමාර් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට කුමන වෙළඳ මහතාද පෝලිමේ සිටිනවා දුටුවේ. මේ වතාවේදී නම් වෙළඳ මහතුන් පෝලිමේ සිටිනවා මා දුටුවා. නැහැයි කියන්නත් බැහැ. මහජනතාවගේ නියොජිතයන් ලෙස ගරු මන්ත්‍රීවරුන් මේ සඳහා අනිවාර්යෙන් තීන්දුවක් ලබාගත යුතුයි. පළමුව ප්‍රීමා පිටි ප්‍රශ්නයෙන් ආරම්භ කරමු. සියළු දෙනා අත්සන් යොදා ලිපියක් දී තිබෙනවා. එවිට ඔහු පවසා සිටින්නේ සියළු ලිපි හා බිල්පත් තිබෙන නිසා කුමන ප්‍රශ්නයක් පැමිණියත් කවුරු ආවත් අපි බය නැහැ කියලයි. එනිසා ප්‍රාදේශීය සභා පනතේ නැති වුවත් ගැටළුවක් නැහැ, අපිට කුමක්ද කළ හැක්කේ කියා බලය යොදාගත යුතුයි. මෙය අනිවාර්යයෙන් යැවිය යුතුයි. මෙය අනිවාර්යයෙන් බැලිය යුතුයි කියන එකයි මා පවසා සිටින්නේ.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
ජනතාවගේ ගැටළු ජනතා නියෝජිතයන් වන අපි තමයි කථා කළ යුත්තේ.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)</u>
අපි අදාල ආයතනය වෙත ප්‍රශ්නය යොමුකරලත් එම ආයතනයෙන් අපට ප්‍රතිචාරයක් නැත්නම් මීළඟට කළ යුත්තේ කුමක්ද කියලයි මා විමසුවේ. අජකට් වලට පැමිණ පරීක්ෂණ කර, මස්කෙළියට පැමිණ බලන්න කියූවිට නොපැමිණෙනවා නම් එය මුළු රටටම පැවසිය යුතු බවත් ඒ සඳහා වැඩපිළිවෙලකට අපි යා යුතු බවත් මා පවසා සිටියේ.

<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>
ප්‍රීමා නියෝජිත මහතා සමග මම දුරකථනයෙන් කතා කර අසා සිටියා පිටි ගෙනවිත් තිබෙන නමුත් ඒවා බෙදා නොහැරීමට හේතුව කුමක්ද? කියා. එතැනට ගොස් එහි සේවය කරන කෙනෙකුගෙන් ඇසුවා. අපි මේටික හැටන්වලට ගෙනියනවා. කාටවත් කියන්න එපා කියා කීවා. නියෝජිතයන් ලෙස ඔබලා මස්කෙළිය, සාමිමලේ නගරවලටයි පිටි බෙදා හැරිය යුත්තේ කියා මා කියා සිටියා. ඔවුන්ට ඩීසල් ප්‍රශ්න තිබෙනවා නම් එයත් අප පිළිගත යුතුයි. පිටි අඩු මිලට තිබුණ අවස්ථාවේදීත් ඒවා වැඩි මිලට විකුණූ අය වැඩි පිරිසක් ඉන්නවා. සියලු දේ සඳහා එක්තරා ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුයි. පිටි තමයි අපගේ ජනතාවගේ ප්‍රධාන ආහාරය. එනිසා ගරු සභාපතිතුමිය මේ සඳහා දැඩි තීරණයක් ලබා ගන්න. අපගේ ප්‍රදේශයේ මන්ද පෝෂණය නිසා දරු මරණ ප්‍රතිශතයත් වැඩි පවමින් පවතිනවා.

<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>
පිටි සම්බන්ධයෙන් බොහෝ කරුණු සාකච්ඡාවට බඳුන් වුණා. මෙම කාරණාව සම්බන්ධයෙන් පාරිභෝගික සේවා අධිකාරිය සහ තත්ව පාලන ආයතනය ආදිය තිබෙනවා. නමුත් ඒ සියලු දෙනා නිහඬව සිටිනවා නම් මෙය තමයි ඒ අයට අවස්ථාව කියා පැහැදිලියි. ශ්‍රී ලංකාවේ මෙවැනි අවස්ථාවක් නැවත ලැබෙයිද කියන එක සැක සහිතයි. අපි සියළු දෙනාම මෙහිදී කතා කර සිටිනවා. අපෙන් කවුරු හෝ ධෛර්යමත්ව ඉදිරිපත් වී පාරිභෝගික අධිකාරියට එරෙහිව නඩු පැවරුවාද? තනි පුද්ගලයෙකුට කළ හැකියි. එමෙන්ම මේ ප්‍රදේශයේ සිදුවණ අක්‍රමිකතා වලට විරුද්ධව කටයුතු කරන්න සභාවට වගකීමක් තිබෙනවා. පාරිභෝගික අධිකාරිය වෙත ලිපි යොමු කරන්න අපට පුළුවනි. ලිපියට පිළිතුරු ලබා නොදෙන අවස්ථා වලදී අපට සභාව මගින් නඩු

පවරන්න පුළුවන්. පිටි සම්බන්ධයෙන් ප්‍රීමා ආයතනයෙන් විමසා සිටියහොත් ඒ අය ළග නිවැරදි තොරතුරු ඇති. මෙහි සිදුවන දේ කවුරුවත් දන්නේ නැහැ. මෙහි සිටින ප්‍රීමා නියෝජිත ළග තිබෙන සියලුම පිටි 07 ස්ටාර් (07 Star) පිටි. පිටතින් ඇති කවරය පමණයි ප්‍රීමා කවරය. කවර ටික මුද්‍රණය කිරීම එතරම් දෙයක් නොවෙයි. මෙම කාරණාව බේකරි නිෂ්පාදකයින් සඳහාත් බලපෑමක් එල්ල කරනු ලබනවා. නිළධාරීන් තමන්ගේ රාජකාරිය නිසි ලෙස ඉටුකරනවා නම් මෙවැනි ප්‍රශ්න ඇති වන්නේ නැහැ. භූමිතෙල් ටික පවා එක් එක් වතුවලට වෙන වෙනම බෙදා හැරිය හැකියි. පිටි පිළිබඳ ප්‍රශ්නය වහාම පාරිභෝගික අධිකාරිය වෙත දැනුම් දෙන්න. හාල් පවා මස්කෙළිය නගරයේ විශාල ප්‍රමාණයක් ගබඩා කර තිබෙනවා. අපි 16 දෙනාම එක්ව කටයුතු කලා නම් අනිවාර්යයෙන්ම හොඳ තීරණයක් ලබා ගත හැකියි.

<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>

ගරු මන්ත්‍රීතුමා දැන් පැවසුවා අළුත් පණිවිඩයක්. ප්‍රීමා පිටිවල මිල ඩැඩ්. 07 ස්ටාර් (Seven Star) නැමැති පිටි වර්ගයක් තිබෙනවා මිල අඩු කියා. එම 07 ස්ටාර් පිටි රැගෙන ප්‍රීමා පිටි අසුරනයට දමා වෙළදාම් කරන බව පවසා සිටියා. මෙම ප්‍රීමා පිටි වෙළඳ නියෝජිතගේ ඉහළ නිලධාරියා සමඟ විනාඩි 20 ක් පමණ මම කතා කළා. එතුමාගේ කතාවෙන් පැහැදිලි වන්නේ, එතුමා මෙහි සිටින නියෝජිතයාට පවසා සිටිනවා හෙට අනිද්දා පිටි මිල ඉහළ යන බැවින් ඔබලා පිටි රැස්කර තබාගන්න යනුවෙන්. මගේ මතය හා සැකය නම් එම ප්‍රීමා පිටි වෙළඳ ආයතනය හා මෙහි නියෝජිතයා සමඟ සම්බන්ධයක් ඇති බව. පිටි මිල ඉහළ ගිය පසු පිටි කිලෝ 1000 ක් තිබුණා නම් දෙදෙනාම අත්වැල් බැද දෙදෙනාම පහාව ලබා ගන්නවා කියන එකයි මගේ සැකය. එනිසා වෙළඳ නියෝජිත මහතා පවසා තිබෙනවා මෙය කිසි කෙනෙකුට වැලැක්විය නොහැකියි, මෙම ප්‍රීමා පිටි නියෝජිතකම මමයි සිදුකරගෙන යන්නේ, තොරතුරු සියල්ල මා ළඟ තිබෙනවා කියා. මන්ත්‍රීවරුන් සියළු දෙනා හාල්පාරුවන් කියා ඔහු නොසිතිය යුතුයි. අපි මෙතැන පොල් ගාන්න නෙවෙයි පැමිණ සිටින්නේ. එනිසා කරුණාකර සභාපතිතුමියනි, මෙයට අනිවාර්යයෙන් සෑම වගකීමක්ම ඔබතුමිය භාරගෙන මන්ත්‍රීවරුන් සියළු දෙනාගේ අත්සනක් ලබාගෙන මේ සඳහා අනිවාර්යයෙන් තීන්දුවක් ලබාගත යුතුයි කියලයි මගේ මතය. වෙළඳ මහතුන්ද මේ පිළිබඳව කටයුතු කරන ලෙස අත්සන් කර ලිපියක් ලබාදී තිබෙන බැවින් ගරු මන්ත්‍රීවරුන්හට අද දිනම මෙය යොමුකර සභාපතිතුමියද අත්සන් කර වහාම මේ සඳහා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>

මස්කෙළි පොලීසිය පිළිබඳව, නගරයේ පිහිටා ඇති සියලුම ගබඩාවන් සම්බන්ධයෙන් ජනතාවට විශ්වාසයක් තිබෙනවා ද කියා මම දන්නේ නැහැ. මට නම් විශ්වාස නැහැ. හමුදාව ගැනත් විශ්වාසයක් නැහැ. විශේෂ කාර්ය බලකාය පිළිබඳව පමණක් විශ්වාසයක් තිබෙනවා. ඒ අයට මේ පිළිබඳව පවසා සිටියහොත් කටයුතු කරයි කියන විශ්වාසය තිබෙනවා. මා හා ගරු සභාපතිතුමිය දීර්ඝ කලකට පසුව බොහොම අමාරුවෙන් මස්කෙළිය පොලීසිය වෙත පැමිණිල්ලක් කළා. පැමිණිල්ල සටහන් කර ගත්තේ නැහැ. නමුත් ඒ හා සම්බන්ධ අයට මේ පිළිබඳව පවසා තිබුණා. මෙය මැයි මස 26 වැනිදා සිදුවූ සිද්ධියක්. මෙය සිදු වූයේ ඉන්ධන පිරවුම්හල තුලයි. එදින එහි සිටි සියලු දෙනා විරුද්ධවාදීන් වූවා. CCTV කැමරා සවි කරන ලෙසට ලේකම්තුමාහට මා පැවසුවා. එතුමා වහාම ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකළා. නමුත් පසුදින එනම්, 27 වැනිදා උදෑසන ඉන්ධන පිරවුම්හලේ ඩීසල්, පෙට්‍රල්, හා භූමිතෙල් තිබුණේ නැහැ. එදින ත්‍රිරෝද රථයේ පිටුපස සිට කහ පැහැති කෑන් එකකට ඉන්ධන ලබාගත් සම්පූර්ණ වීඩියෝ දර්ශනය ගරු සභාපතිතුමියද දුටුවා. මෙම වීඩියෝ දර්ශනය මම යම්කිසි සමාජ මාධ්‍ය ජාලයක් ඔස්සේ ප්‍රසිද්ධ කර තිබුණා නම් ඉන්ධන පිරවුම්හල වහන්න සිදු වෙනවා. ජනතාව කුපිත වෙනවා. සාමිමලේ ප්‍රාදේශයේ ත්‍රිරෝද රථයක් සඳහායි මෙය පටවා තිබෙන්නේ. පොලිස් නිලධාරීන්ද සහය ලබාදී තිබෙනවා. මෙවැනි වැඩවලට අවශ්‍ය ක්‍රියාමාර්ග ලබාගත යුතුයි. මෙම වීඩියෝ දර්ශනය යොමුකළ යුතු තැනට යොමුකිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමු.

මීළඟ විෂය තමයි මෑතකදී මස්කෙළිය නගරයේ සහල් නැති බවට මුහුණු පොතේ සඳහන් කර තිබුණා. ඉන් පසුව එය සත්‍ය කථාවක් බවට පත්වුණා. මස්කෙළිය නගරයේ පිහිටි කිසිදු කඩයක සහල් තිබුණේ නැහැ. උදේ වරුවේ තිබුණ සහල් තොග සියල්ල සඟවා සිටියා. පිටි වලටත් මෙලෙසමයි සිදුවුයේ. භූමිතෙල් සඳහාද විශාල හිඟයක් පවතිනවා. ගෑස් සහ භූමිතෙල් මෙහි සිට කොළඹට යවනවා. නියොජිතයින් මෙම සිද්ධීන් දන්නවාද මම දන්නේ නැහැ. ජනතාව නිසා තමයි මේ අය මුදලාලි වෙලා සිටින්නේ. මේ සියලු දෙනාටම ප්‍රතිවිපාක තිබෙනවා. ඒ අනුව මෙම යෝජනාව මගින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නේ නම් ජනතාව මුහුණ දෙන ගැටළු සඳහා එක්තරා ආකාරයකට විසඳුම් ලබාදිය හැකියි.

**ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)**

ගරු සභාපතිතුමියනි, සභාපති කියන්නේ මේ නගරයේ පළමුවන පුරවැසියයි. එතුමියගේ යම්කිසි ප්‍රශ්නයක් සඳහා ආයතනයන්හි සභාපතිවරුන් සවන් නොදෙන්නේ නම් එම ආයතනවල සිටින ප්‍රධානීන් හරහා ඔබතුමියට කෙළින්ම දුරකථනයෙන් කතාකර මේ දේ විසඳිය හැකියි නේද? එය ක්‍රියාත්මක කළ හැකියි නේද? මෙම නගරයේ පළමුවන පුරවැසියාට මේ අයුරින් ප්‍රශ්නයක් තිබෙනවා නම් සාමාන්‍ය බිම් මට්ටමේ සිටින අනෙක් පුරවැසියන් සඳහා කොහොම ප්‍රශ්න ඇතිද? එනිසා එම බලය ක්‍රියාත්මක කරගෙන එම බලය අතට අරගෙන වැඩකළ යුතුයි. ඒ අදාල සමූපකාර ආයතනය තමයි ඉන්ධන පිරවුම්හල පවත්වාගෙන යනු ලබන්නේ. එයට අදාලව සිටින උසස් නිලධාරීන්ට මේ ගැන කරුණු යොමු කළහොත් එම අවස්ථාවේදීම මේ සඳහා ක්‍රියා මාර්ගයක් ගත හැකියි. එය නොදන්න එක තමයි තිබෙන ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

ඉන්ධන පිරවුම්හලේ කළමණාකරන මහතාට මම දුරකථන මාර්ගයෙන් කතාකර විමසා සිටියා මෙම ටෝකන් ලබාදීමේ ක්‍රමවේදය කොහොමද කරන්නේ?, කාටද මෙය ලබා දෙන්නේ කියා. ඔහු පැවසුවා ටෝකන් ලබාදීම සිදු කරන්නේ පොලිසිය මඟින් බව. ටෝකන් එක පොලීසියේ ලබාදෙන බව මහජනතාව දැනුවත් කර තිබෙනවාද? පොලියේ රාජකාරිය මෙයද කියා මම විමසුවා. එවිට එතුමා මගෙන් ආපස්සට විමසා සිටිනවා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ගේ රාජකාරිය අපේ ඉන්ධන පිරවුම්හලට අත ගහන එකද කියා. පොලීසියෙ රාජකාරිය එය නම් ඔබලාගේ රාජකාරිය මෙයද? ඇයි සභාව මේ සඳහා අත දාන්නේ කියා විමසනවා. අපි සමූපකාරයට අත දානව නම් පුද්ගලයෙක් වශයෙන් කළමණාකාරතුමාට අත ගහනවා කියන එකනේ මෙහි තේරුම. එහෙම නෙවෙයි. අදාල ආයතනය පිළිබඳවයි අපි කතා කරන්නේ. අපේ සභාවට කතා කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා සභාපතිතුමිය හා ලේකම්තුමා සිටිනවා. ඒ ආකාරයෙන් මෙහි භාරව සිටින අය තමයි මෙය භාරගත යුත්තේ. එක් පුද්ගලයෙක් සඳහා කොහොමද ලීටර් 100 ක් ලබාදුන්නේ, පෝලිමේ සිට ලීටර් 5 ක් 10 ක් බැගින් ලබා ගත්තාද? කියා විමසා සිටියා. මේ නිසා තමයි ක්‍රමවේදයක් සකස් කළ යුත්තේ. එනිසා මේ සඳහා වහාම තීන්දුවක් ලබාගත යුතුයි. නැත්තම් මහජනතාව පාරට බැහැල යම් ප්‍රශ්නයක් සිදුවුව හොත් එහි වගකීම අපට භාරගන්න බැහැ.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිනිය (ලං.ක.කො)**

ඔව්, එතැනට කවුරුන් පැමිණ කෑගසා සිටියත්, ඒ අය නිසි අයුරින්මයි වැඩකටයුතු ඉටුකර සිටින්නේ කියා ත්‍රිරෝදරථ හිමිකරුවන් කියා සිටිනවා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

සමූපකාර සමිතිය කියන්නේ අපගේ ආයතනයක් තමයි. නමුත් ඒ අය සිතනවා එම ආයතනය අධීක්ෂණය කරන්න කිසිවෙක් නැහැ කියා. අප විසින් ඉටු කරන සියලු කටයුතු කොමසාරිස්තුමා ගේ සිට ගරු ආණ්ඩුකාරතුමා, කොමසාරිස්තුමා, සහකාර කොමසාරිස්තුමා වැනි අය අධීක්ෂණය කළ යුතුයි. මෙවැනි දේ සිදුවන අවස්ථාවේදී ඒ අය පැමිණ පරීක්ෂා කළ යුතුයි. මෙම සභාවේ යම් ගැටලුවක් මතුවන අවස්ථාවේදී වහාම අපට ලිපි යොමුකර සිටිනවා. සමූපකාර සමිතියේ සිදුවන ගැටළු සම්බන්ධයෙන් මම මීට පෙර සභාවට පවසා තිබෙනවා. කොවිඩ් වසංගත කාලයේ දී සියලුම ආයතන සම්බන්ධ කර කමිටුවක් පත් කර තිබුණා. ඒ අවස්ථාවේ ගැටළුවලට පහසුවෙන් විසඳුම් ලබාගත හැකි වූවා. දැන් එලෙස සිදු නොකරන්නේ ඇයි? මෙහිදී දකින්න තිබෙන ප්‍රශ්න සියල්ල ඍජුවම ගරු ආණ්ඩුකාරතුමා වෙත දන්වන්න. සමූපකාර සමිති සාමාජිකත්වය පිළිබඳව ද කරුණු තිබෙනවා. සාමාජිකත්වය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුයි.

**තීරණ අංක 08**

**ප්‍රීමා පිටි සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය, ගරු ආණ්ඩුකාරතුමා, දිස්ත්‍රික් ලේකම්තුමා, පාරිභෝගික අධිකාරිය යන ආයතනවලට ලිපියොමු කිරීමට තීරණය කරන ලදී.**

**තීරණ අංක 09**

**මස්කෙළිය නගරය තුල විවිධ සේවා සමූපකාරය මඟින් ඉන්ධන ලබාදීමේදී මහජනතාවට විවිධ ගැටළුකාරී තත්වයන් මතුවන බැවින් ඉන්ධන ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකස්කර දෙන ලෙස ඉල්ලමින් සමූපකාර කොමසාරිස්තුමාට ලිපියක් යොමු කිරීමට තීරණය කරන ලදී.**

**තීරණ අංක 10**
**මස්කෙළිය නගරයේ ව්‍යාපාරිකයන් විසින් වෙළඳ භාණ්ඩ වල මිල ගණන් වැඩියෙන් විකිණීම හා ද්‍රව්‍ය සඟවා, ගබඩාකර තබා ගැනීම සම්බන්ධයෙන් පාරිභෝගික සේවා අධිකාරිය වෙත ලිපියක් යොමුකිරීමට තීරණය කරන ලදී.**

**තීරණ අංක 11**
**අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදා හැරීම සඳහා ක්‍රමවේදයක් සකස්කර ගැනීමට මස්කෙළිය ප්‍රාදේශීය සභාව, මස්කෙළිය පොලිසිය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, විවිධ සේවා සමූපකාර සමිතිය හා වෙළඳ සංගමය සහ ගෑස් නියෝජිත ආයතන සමඟ සාකච්ඡාවක් පැවැත්වීමටත් ත්‍රී රෝද රථ සඳහා අය කරන ගාස්තුව සම්බන්ධයෙන් ත්‍රී රෝද රථ සංගම් සමග සාකච්ඡා කිරීමටත් තීරණය කරන ලදී.**

<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>
මාගේ මීළඟ යෝජනාව වන්නේ, මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ සේවය කරන තාවකාලික සේවකයින් සහ සනීපාරක්ෂක සේවකයින් පිළිබඳවයි. මෙම සේවකයින් සියලු දෙනා ස්ථිර කළ යුතු බවට විවිධ අවස්ථාවලදී මෙම සභාව මගින් ඉල්ලා සිටියා. අපගේ ප්‍රාදේශීය සභාව පිළිබඳව හොඳ නාමයක් ලැබී තිබෙනවා නම්, ඊට හේතුව සනීපාරක්ෂක සේවකයිනුයි. රිකාටන් කසළ කළමනාකරණය කිරීමේ කටයුතු වල බොහෝ තරුණ තරුණියන් නියළී සිටිනවා. සභාවේ සිටින අනෙකුත් නිලධාරීන් සියලු දෙනාට ස්ථිර පත්වීම් ලබාදී තිබෙනවා. නමුත් මෙම තාවකාලික සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ලබා නොදුන්නේ අයි? ඊට හේතුව කුමක්ද?

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
මේ කාරණාව සම්බන්ධයෙන් සභාවෙන් ඉටු කළයුතු සියලු කාර්යයන් ඉටුකර තිබෙනවා. අමාත්‍යතුමා හට නාම ලේඛන විස්තරත් ලබාදී තිබෙනවා.

<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>
සභාවට යහපත් නාමයක් ලබාදෙන මේ අයට ස්ථිර පත්වීම් ලබාදිය යුතුයි.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
මීළඟට ගරු මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා ගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>
මාගේ පළමුවැනි යෝජනාව වන්නේ, වතු ආශ්‍රිත ප්‍රදේශවල පිහිටි මුඩු ඉඩම් පිළිබඳවයි. රටතුල ඉතා ඉක්මනින් සාගතයක් ඇතිවනු ඇතැයි සියලු දෙනා පවසා සිටිනවා. එනිසා ගොවිතැන මගින් ආහාර සපයා ගැනීමේ ක්‍රියාමාර්ග ගන්නා ලෙස සියලු දෙනා විසින් පවසනු ලබනවා. රටේ ඇති මුඩු ඉඩම් භාවිතා කරමින් ගොවිතැන් කරන ලෙසට රටේ අග්‍රාමාත්‍ය තුමා ද පවසා තිබෙනවා. ගම්මාන සඳහා මෙය සුදුසු වුවද වතු ප්‍රදේශයට මෙම ක්‍රමය සුදුසු වන්නේ නැහැ. වතු ආශ්‍රිත ඉඩම් සියල්ල එක්තරා සමාගමක් යටතේ පවතිනවා. මෙය ඉටු කළ හැක්කේ සමාගම් සමඟ සාකච්ඡා කර ලබා දුනහොත් පමණයි. එනිසා මේවා ලබාදීමට කටයුතු කළ යුතුයි. මෙම මුඩු ඉඩම් තරුණයින්ට ලබා දීමට කටයුතු කරන්නේ නම් විවිධ ප්‍රදේශ සඳහා ආහාර ද්‍රව්‍ය ලබා දීමට ඔවුන්ට අවස්ථාව ලැබෙනවා. හැකි ඉක්මනින් වතු පරිපාලනය සහ සමාගම් සමග සාකච්ඡා කර ඒ සඳහා කටයුතු කරන ලෙසට ඉල්ලා සිටිමි.

<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>
ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ පිහිටි මුඩු ඉඩම් සම්බන්ධව තොරතුරු ලබාගෙන තිබෙනවා. හැකි ඉක්මනින් සමාගම් සමග සාකච්ඡා කරනු ඇතැයි අදහස් කරමි. අපිත් බලපෑමක් කරමු.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
එසේ ලබාගන්නා අවස්ථාවේදී ග්‍රාම නිලධාරි මහතා ද සම්බන්ධ කරගනිමින් ප්‍රාදේශීය සභාව මගින් මෙම ඉඩම් ලබාදීමට කටයුතු කළ යුතුයි. නැතිනම් මුඩු ඉඩම් පිටස්තර පුද්ගලයින්ට ලබාදීමේ අවස්ථාවක් ද උදා වේවි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
ඔබතුමා පවසන දේ නිවරැදියි. නිව්වෙලි වතු ප්‍රදේශයේ මෙවැනි සිදුවීමක් සිදු වී තිබෙනවා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මෙම කරුණ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුයි. සභාව මගින් මේ සඳහා කමිටුවක් පත් කරන්නේ නම් වඩාත් සුදුසුයි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
ග්‍රාම නිලධාරි මහතා මේ පිළිබඳව දැනුවත් කලා නම් වඩාත් සුදුසුයි. අදාල අමාත්‍යාංශයත් මේ පිළිබඳව දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)**
මේ පිළිබඳව සමාගම් සමග මමත් සාකච්ඡා කරලා තිබෙනවා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**
දැනට වතුකර ප්‍රදේශයේ බොහෝ තරුණයින් රැකියාවක් නොමැතිව සිටිනවා. මේ පිළිබඳව මම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග කතා කර තිබෙනවා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් සමහ සාකච්ඡා කළ අවස්ථාවේදී ග්‍රාම සංවර්ධන සමිති සහ අනෙකුත් සංගම් ඒකාබද්ධ වී පොදු වැඩසටහනක් දියත් කරන ලෙසට පැවසුවා. ඒ සඳහා වූ වැඩ කටයුතු අපි දැනට ආරම්භ කරල තිබෙනවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
කොට්ඨාශ මට්ටමින් ග්‍රාම නිලධාරී සම්බන්ධ කර ගනිමින් ඒ සඳහා වූ වැඩකටයුතු ආරම්භ කරන්න.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මාගේ මීළඟ යෝජනාව වන්නේ අධික වර්ෂාව නිසා දැනට පැතිරෙමින් පවතින ඩෙංගු රෝගය පිළිබඳවයි. නිවසේ එකතු වන කසළ වලින් අවශ්‍ය, අනවශ්‍ය කසළ විධිමත්ව වෙන්කර ගත යුතුයි. කසළ වෙන් කර එකතු කර ගනිමින් ඒවා පොහොර බවට පත් කළ හැකියි. මට පැවසිය යුත්තේ මෙයයි. ඩෙංගු රෝගයේ රෝගයේ ව්‍යාප්තිය මේ වන විට වැඩිවී තිබෙනවා. මේ වන විට එක පැත්තකින් ආර්ථික ප්‍රශ්න. අනෙක් පැත්තෙන් රෝහල්වල බෙහෙත් හිඟතාවය පවතිනවා. මෙවැනි අවස්ථාවක රෝග තත්ත්වය වැඩි වුනොත් අපි කොහොමද ඒ අයව බේරා ගන්නේ. එනිසා කසළ වෙන්කර ගැනීම සහ ඒවා පොහොර බවට පත්කර ගැනීම පිළිබඳවූ කරුණු සම්බන්ධයෙන් ජනතාවට කරුණු පැහැදිලි කර දිය යුතුයි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
කොට්ඨාශ මට්ටමෙන් මේ සඳහා කටයුතු කරන අතර, මේ සමගම මා විසින් පවසන ලද මත්ද්‍රව්‍ය නිවාරණ පිළිබඳ කාරණාව ද සම්බන්ධ කරගන්න.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මත්ද්‍රව්‍ය නිවාරණ සම්බන්ධ සියලුම වගකීම ආරක්ෂක අංශය වෙත තියෙනවා. අපට තොරතුරු පමණක් ලබා දෙන්න පුළුවන්. ඒ අය ක්‍රියාමාර්ග ගත යුතුයි. දරුවන් මෙහෙකාර සේවයට යොදා ගැනීම පිළිබඳව

සභාවේ දී මීට පෙර පවසලා තියෙනවා. ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග අරගෙන තියෙනවද? ඒ අයටත් මේකේ සම්බන්ධතා තියෙන්නෙ පුළුවන්. තවද කසල පිළිබඳව තීරණයක් ලබා ගන්න. මාගේ අවසන් යෝජනාව වන්නේ අපගේ ප්‍රාදේශීය සභාවෙන් සිදු කරන කාබනික පොහොර පිළිබඳවයි. මෙම කාබනික පොහොර කෙතරම් දුරට ප්‍රයෝජනවත් වෙනවද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
බොහෝ දෙනෙක් මෙම කාබනික පොහොර මිලදී ගන්නවා. හොඳ ප්‍රමිතියෙන් යුතුව තිබෙනවා. ආරම්භයේදී නයිට්‍රජන් ප්‍රමාණය වැඩියෙන් අඩංගු බවට කිව්වා. දැනට එය සමාන කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ලබාගෙන තියෙනවා. තුන් වන වතාවටත් පරීක්ෂණය සඳහා යවලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මේ සම්බන්ධව පරිසර අධිකාරියේ නිලධාරියෙකු සමග මා සාකච්ඡා කළ අවස්ථාවේදී මෙම පොහොර අපගේ පසට සුදුසු නැති බව පැවසුවා. මේ දක්වා නිවැරදි බවට පරීක්ෂණ වාර්තාව ලැබිලා නැති බවත් පැවසුවා. එසේ නම් අපි පොහොර වෙළඳාමක් සිදු කරමින් ජනතාව රවටනවද? නමුත් මෙම යෝජනාව මා ඉදිරිපත් කිරීමට වෙනත් හේතුවක් තියෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයටත් මෙම පොහොර රැගෙන ගිහින් හොඳ ඵලදායිතාවක් ලබා ගෙන ඇති බවට පවසලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
අපි යෝජනාව ඉදිරිපත් කරන්නේ ගරු සභාපති තුමියගේ ලිපිනයටයි. ඊළඟට යෝජනාව යොමුවෙන්නේ ලේකම්තුමාටයි. මේවා සෘජුවම නිලධාරීන්ට යන නිසා තමයි මා මෙහිදී කතා කළේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
යෝජනාව සම්පූර්ණයෙන් ලිඛිතව ලබා දෙන්නේ නම් මෙවැනි ගැටලු මතුවෙන්නේ නැහැ.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඇත්තටම මෙම කාල වකවානුවේදී සහනදායි අඩු මිලකට මෙම පොහොර ජනතාවට ලබා දිය යුතුයි යන හැඟීමකින් තමයි මෙම යෝජනාව මා ඉදිරිපත් කලේ.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**
මෙම පොහොර සමග ගොමත් මිශ්‍ර කරගත්තානම් තවත් ප්‍රමිතියෙන් වැඩි වෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ සමඟ අද දින මෙම සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මෙයින් සභාවේ වැඩ කටයුතු අවසන් කර සිටිමි.

ස්තූතියි.
ආයුබෝවන්.

| | |
|---|---|
| සභාපති,<br>මස්කෙළිය ප්‍රාදේශීය සභාව,<br>මස්කෙළිය. | ලේකම්,<br>මස්කෙළිය ප්‍රාදේශීය සභාව,<br>මස්කෙළිය. |